**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට **අනුකූල නොවීම**

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.42,275,685 ක ප්‍රාග්ධන ආධාර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.<br><br>(ආ) අංක 3.13 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ ඇතුළත් ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ගණන් දීමේ නිලධාරින් විසින් සහතික නොකරන ලද හා ගණන් පෙන්වා නොතිබූ හිස් වාර්තාවක් ඉදිරිපත් කර තිබු හෙයින් 2021 දෙසැම්බර් 31 දිනට වූ සමුච්චිත අරමුදලේ රු.204,292,317ක ශේෂයද,රු.764,862,957 ක් වූ ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම හා රු.46,022,990 ක් වූ ප්‍රාග්ධනයට පරිත්‍යාග මඟින් දායකවීමේ ගිණුමේ ශේෂයන්ද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්විය යුතු වූවද වෙළඳ ගෙවිය යුතු දෑ ලෙස සටහන් අංක17 යටතේ වත්කම් වගකීම් ප්‍රකාශනයේ වගකීම් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදිව ආකෘතිපත්‍ර සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වන ප්‍රමිත උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 6 වගන්තියේ ආකෘතිය ප්‍රකාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. . | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදිව ආකෘතිපත්‍ර සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම ගැලපීමේදී වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් අතිරික්තයට/ඌනතාවයට හඳුනා ගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම අඩුකොට ඉතිරිය අතිරික්තයට/ඌනතාවයට එකතු කර වර්ෂයේ විස්තීර්ණ ආදායම දැක්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී, අතිරික්තයට වර්ෂය සඳහා වූ මුළු ප්‍රාග්ධන ප්‍රදාන වියදම් ප්‍රදාන අඩුකර හඳුනා ගත් වියදම් ප්‍රදාන එකතුකොට දැක්වීමෙන් රු.113,186,756 කින් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදිව ආකෘතිපත්‍ර අනුව සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | මුළු ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් වර්ෂයේ ආදායමට හඳුනා නොගත් ප්‍රදාන වටිනාකම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ අතිරික්තයට/ඌනතාවයට එකතු කර දැක්විය යුතු සේම රු.56,593,378 ක් වූ එම වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ මුළු වගකීම්වලට එකතුකර දැක්විය යුතු වුවත් එසේ කර නොතිබීමෙන් ස්කන්ධය හා මුළු වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී කර්මාන්ත සඳහා සෘජු ශ්‍රම පැය 2108 ක් යෙදවීම වෙනුවෙන් රු.2,389,900 ක් හා ඉදිරියට ගෙවීම් කිරීමට නොමැති රු.18,736,393 ක් ණයහිමි වෙන්කිරීම් තුලින් රු.21,126,293 කින් ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ගස්ථ මෘදුකාංග පද්ධතිය සඳහා වැයකළ රු.2,390,000 ක් වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් අතිරික්තය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 ජර්නල් අංක 03 මගින් නිවැරදි කර ඇති බව දන්වමි. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ප්‍රාග්ධන වියදම් දීමනා රු.98,869,062 කින් රු 42,275,685 ක් මුදල් ලැබී තිබුණු අතර රු.56,593,377 ක් කර්මාන්ත ණයගැතියන් වූවද රු.35,788,249 ක් ගිණුම්ගත කර තිබීමෙන් රු.20,805,128 ක් ණයගැතියෝ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදි ආකෘතිපත්‍ර අනුව සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ |
| (ඊ) | සභාව සතු දේපල 47 ක් රු.780,412 කට වරිපනම් ගාස්තු අය කිරීම බිල් කිරීම්වලට ඇතුළත් කර තිබූ අතර එම ප්‍රමාණයෙන් වරිපනම් බදු හිඟ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දේපළ 08 කට අදාල රු.523,243 ක වරිපනම් බදු හිඟ ශේෂයන් දෙවරක් දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වරිපනම් බදු හිඟ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | එම දේපළ හඳුනාගෙන පරිගණක පද්ධතිය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 05 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.18,127,834 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 සිට 2006 වර්ෂය දක්වා කාල සීමාව තුළදී ගෙවන ලද රු.784,907 ක අත්තිකාරම් ශේෂයක් අත්තිකාරම් ගිණුම තුළ ඉදිරියට ගෙනැවිත් තිබූ අතර මෙතෙක් ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය වසර 15 ක් ඉක්මවූ අත්තිකාරම් ශේෂයකි. මේ සඳහා කමිටුවක් පත් කර සුදුසු පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (I) අංක 571(3) | (i) මහජන සෞඛ්‍ය පරීක්ෂක දඩ මුදල් ලෙස අධිකරණය මගින් 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සභාවට එවා ඇති රු.291,557 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| | (ii) 2013 වර්ෂයේදී දේපල සමාගමක් මගින් දෙවලපල මීගස්පිටිය එස්ටේට් ඉඩමේ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ රු.1,000,000 ක් හා එම වර්ෂයේදී නිල්පනාගොඩ වෙන්දේසි ඉඩමේ ජල ටැංකියක් සෑදීම සඳහා ලබාදී තිබූ රු.2,000,000 ක් අදාල කාර්ය සඳහා යෙදවීමෙන් තොරව තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂා කර බලා සුදුසු කටයුතු සිදු කරන බව දන්වමි. | අදාල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.171,652,556 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,012,252,654 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකමින් රු.50,000 ඉක්මවා තිබූ වරිපනම් ඒකක 19 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.1,904,843 ක් වී තිබුණි. | දේපළ තහනම් කිරීමේ නිලධාරීන් මගින් හෝ හිඟ ආදායම් රැස් කිරීමට නොහැකි තත්වයක් උද්ගතව ඇති අතර ඉදිරියේදි හැකි උපරිම ආකාරයෙන් හිඟ අයකිරීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ කුලී හිඟය තුළ, කඩ කුලී හා බදුකර කුලී හිඟ පිළිවෙලින් රු.201,280 ක් හා රු.700,333 ක් වූවද එම කඩ කුලී හිඟයෙන් සමාලෝචිත වර්ෂයට අය කර තිබුණේ රු.10,000 ක් වූ අතර බදුකර හිඟයෙන් කිසිදු මුදලක් අයකර නොතිබුණි. | සභා අනුමැතිය ලබාගෙන පළාත් පාලන කොමසාරිස් හරහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් හිඟ අයකිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දේශීය ණය සහා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලකින් 2014 ඔක්තෝබර් 02 දින රු.32,500,000 කට අක්කර 13 රූඩ් 02 පර්චස් 12.7 කින් යුත් මාබෝදල ගෝනමඩෙවත්ත ඉඩම මිලදී ගෙන තිබුණි. මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති වාර්තාව අනුව වාර්ෂිකව පොල්ගෙඩි 48000 ක ඵලදාවක් ලැබෙන බව දක්වා තිබෙන හෙයින් ඒ අනුව පොල්ගෙඩියක මිල රු.60 ක් ලෙසද කැඩීමේ වියදම මසකට රු.8,000 බැගින් සැලකූ විට වාර්ෂිකව රු.2,784,000 ක ආදායමක් ලැබිය යුතු විය. නමුත් 2021 වර්ෂයේදී ලැබූ ආදායම රු.591,130 ක් වූ අතර | මෙම ඉඩමේ පවතින මිල අධික ගස් වර්ග හඳුනාගෙන විස්තරාත්මක වාර්තාවක් සකස් කිරීමට මාබොදල උප කාර්යාලයේ ආදායම් පරීක්ෂක නිලධාරියාට දන්වා ඇති අතර ඒ අනුසාරයෙන් ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරන | ඵලදාව වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු අතර වටිනා දැව වර්ග ලේඛනගත කළ යුතුවේ. |

| | |
|---|---|
| මිලදී ගත් වසරේදී සිටම මේ දක්වා එම ඉලක්කය කරා ළගා වීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ඉඩමේ පවතින කොස්, තේක්ක, මහෝගනී, මිල්ල වැනි මිල අධික ගස් වර්ග හඳුනාගෙන අංක කර ලේඛනගත කර ද නොතිබුණි. | බව දන්වමි. |

## 3.2 ඉටුනොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒරියල් වර්ක් ෆැලැට්ෆෝම් රථයක් සැපයීම සඳහා 2019 වර්ෂයේ රු.16,500,000 ක් පෞද්ගලික ආයතනයක නාමයෙන් ණයහිමි වෙන් කිරීම් සිදු කර තිබුණද 2022 අප්‍රේල් 30 දින වන විටත් එය ලබා ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය රටේ පවතින තත්ත්වය මත ප්‍රමාදයක් සිදු වුවත් තව දුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියක් බව දන්වමි. | ගිවිසුම්ගතව තිබූ ව්‍යාපෘති අප්‍රමාදව ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීම ප්‍රමාද කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් මගින් මහගම පිහිටි සභාවට අයත් ඉඩමේ ප්‍රජාශාලාවක් ඉදිකිරීමේ I අදියර සඳහා 2018 වර්ෂයේදී රු.499,817 ක් වියදම් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණද 2018 ආරම්භ කළ ඉදිකිරීම් වැඩ 2022 අප්‍රේල් මස දක්වා සිදු නොකිරීමෙන් රු.499,817 ක මූලික වියදම් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | සභා අනුමැතිය ගෙන ණයහිමි කපා හැරීමට කටයුතු කර ඇති බව දන්වමි. | වෙන් කළ මුදල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |